DOI : 10.31357/fhssmst.2004.00690

# ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සමිතියේ අරමුණු හා කාර්ය සාඵල්‍යය (1845-1995) - ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනවලට ඒ තුළින් ලැබුණු දායකත්වය පිළිබඳ විශේෂ අවධානය යොමුකරමින්

එම්. ඒ. එස්. ආර්. සංජීව් මන්ත්‍රිරත්න

G.S/S.S./599/98

ඉතිහාසය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කරනු ලබන නිබන්ධය 2004.

## පර්යේෂකයාගේ ප්‍රකාශය

මෙම පර්යේෂණ නිබන්ධය උපදේශකවරයාගේ අනුමැතියට යටත්ව මම ස්වාධීනව සම්පාදනය කරන ලද්දක් බවට මෙයින් සහතික කරමි.

පර්යේෂකයාගේ අත්සන

## උපදේශකගේ ප්‍රකාශය

ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සමිතියේ අරමුණු සහ කාර්යසාඵල්‍යය (1845-1995)- ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනවලට ඒ තුළින් ලැබුණු දායකත්වය පිළිබඳ විශේෂ අවධානය යොමුකරමින්, නැමැති මෙම පර්යේෂණ නිබන්ධය මාගේ උපදෙස් පරිදි මෙම පර්යේෂකයා විසින් සම්පාදනය කරන ලද බව මෙයින් සහතික කරමි.

.......................................

උපදේශකගේ අත්සන

# ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සමිතියේ අරමුණු හා කාර්ය සාඵල්‍යය (1845-1995) - ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනවලට ඒ තුළින් ලැබුණු දායකත්වය පිළිබඳ විශේෂ අවධානය යොමුකරමින්


එම්. ඒ. එස්. ආර්. සංජීව් මන්ත්‍රීරත්න

G.S./S.S./599/98


ශාස්ත්‍රපති

2004

# උපකාරක සැමරුම්

පර්යේෂණ මාතෘකාව අනුමත කර දෙමින් මා ලවා හොඳ පර්යේෂණයක් කරවීමේ අරමුණින් යුතුව නිරන්තරයෙන් ඒ පිළිබඳ විමසමින් සහ උපදෙස් ලබාදෙමින් මා පර්යේෂණය වෙතට ම යොමුකළ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එස්. බී. හෙට්ටිආරච්චි ගුරු පියාණන්ට මාගේ හෘදයාංගම ස්තුතිය පිරිනමමි.

මෙම කටයුත්තේ දී මා දිරිමත් කළ මහාචාර්ය ඩී. ඇල්. අබේවර්ධන, මහාචාර්ය මාලනී ඇඳගම සහ මහාචාර්ය ටී. ජී. කුලතුංග යන ගුරුභවතුන්ට සහ පූජ්‍ය හබරකඩ වජිර ස්වාමීන් වහන්සේට මෙන් ම පද්මසිරි කන්නන්ගර යන ගුරුභවතුන්ට මාගේ ගෞරව ප්‍රණාමය පුද කිරීමට මෙය අවස්ථාවක් කරගනිමි.

එමෙන්ම ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් වන නන්දනී කරුණාතිලක සහ ජී. බී. මණ්ඩාවල යන මහත්ම මහත්මීන් හා මා සමඟ සහෝදරත්වයෙන් කටයුතු කරන ඇලෙක්සැන්ඩර් කපුකොටුව මහතාත් මෙහිදි සිහිපත් කරමි.

පර්යේෂණය සම්බන්ධ ගැටලු අවස්ථාවල දී පමණක් නොව විවිධ දුෂ්කර අවස්ථාවල දි මා හට අනුශාසනා කරමින්, පර්යේෂණ කටයුතු සඳහා මා දිරිමත් කළ කථිකාචාර්ය පූජ්‍ය දඹර අමිල ස්වාමීන් වහන්සේට ගෞරවනීය ස්තුතිය පුද කරමි.

පර්යේෂණ නිබන්ධ මාතෘකාව පිළිබඳව කන වැකුණු දා සිට ඒ පිළිබඳ කරුණු සොයා දෙමින් ද, දුෂ්කර අවස්ථාවල දී මා අස්වසමින් ද අත්පිටපත් සකස් කිරීමෙන් පසු එය මුල සිට ම අගට කියවා වියරණ දොස් මගහරවා දීමෙන් ද මා හට උපකාර කළ සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාරිණී කුසුමලතා ලංකාමුල්ල මහත්මියට,

නිබන්ධය පරිගණක ගත කිරීමේ දී ඇති වූ දුෂ්කරතාවල දී අවශ්‍ය උපදෙස් ලබාදීමෙන් සහ අත්‍යාවශ්‍ය අවස්ථාවල දි ඒවා පරිගණකගත කිරීමෙන් ද උපකාරකළ භූගෝලවිද්‍යා අධ්‍යයනාංශයේ කථිකාචාර්ය පූජ්‍ය පින්නවල සංඝසුමන ස්වාමීන් වහන්සේට සහ පාලි ග්‍රන්ථ

පරිශීලනනය කිරීමේ දී අවශ්‍ය පාඨ සරල සිංහලයෙන් කියාදුන් පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ පූජ්‍ය මැස්ටියේ උපනන්ද ස්වාමීන් වහන්සේට ගෞරවනීය ස්තුතිය පුද කරමි.

ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශයේ සේවය නියුතු එරංගාට, ග්‍රන්ථයේ අත්පිටපත් පරිගණක ගතකිරීමේදී සහයදුන් සුරේෂ්, වායා, සාමා, නිලන්ති යන අය කෘතවේදීත්වයෙන් සිහිපත් කරමි.

මාහට නන් අයුරින් උපකාර කළ ජයලතා, දම්මිකා, ඉරේෂා, ශාන්ත යන අප විශ්වවිද්‍යාලයේ සහෝදර ලබඳ ලැබැදියන්වත් මෙහිදී සිහිපත් කරමි.

අප විශ්වවිද්‍යාලයේ පුස්තකාලයේ පුස්තකාලාධිපති පී. විදාන පතිරන මහත්මාත්, සහකාර පුස්තකාලාධිපති කුලතුංග මහත්මියත්, පුංචිබණ්ඩා ගල්ලබ මහතාත්, රසාලි මෙනෙවිය මෙන් ම පොතක් පිළිබඳ තොරතුරු විමසූ කළ නොපැකිල එය ඉටුකළ පී. නිශ්ශංක, ආනන්ද ජයසිංහ යන මහතුන්ට ද මාගේ අවංක ආදර ස්තුතිය පිරිනමමි.

ජාතික කෞතුකාගාර පුස්තකාලයේ සහ ජාතික ලේඛනාරක්‍ෂක දෙපාර්තමේන්තුවේ සේවක මහත්ම මහත්මාදීන්ටත්,

රාජකීය ආසියාතික සමිතියට අයත් පුස්තකාලය තුළට ගොස් ග්‍රන්ථ පරිශීලනය කිරීමට අවසර ලබාදුන් එවකට සමිතියේ සභාපති මහාචාර්ය එම්. බී. ආරියපාල මහතා ඇතුලු එහි නිලධාරී මණ්ඩලයෙන් සහ අනෙකුත් සේවක භවතුන්ගෙන් ලැබුණු සහයෝගයට කෘතඥ වෙමි.

දුකේදී මෙන්ම සතුටේදීත් මා සමඟ සිටිමින් මා නිරන්තයෙන් දිරිමත් කරන ආදරණීය මෑණියන්ට සහ පියාණන්ට නිරෝගී සුවයත්, දීර්ඝායුෂත් ප්‍රාර්ථනා කරමි.

මාගේ අභිවෘද්ධිය ප්‍රාර්ථනා කරන මාගේ සහෝදරයින් තුන්පළත් සහෝදරියත් මේ අවස්ථාවේ සිහිපත් කරන්නේ හදබැඳි සොනෙහසිනි.

# සංක්ෂේපය

# ABSTRACT


ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සමිතියේ කාර්යසාඵල්‍යය (1845-1995)- ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනවලට ඒ තුළින් ලැබුණු දායකත්වය පිළිබඳ විශේෂ අවධානය යොමුකරමින්.

ඉහත සඳහන් මාතෘකාව යටතේ සිදුකළ මෙම පර්යේෂණය පරිච්ඡේද පහකින් යුක්ත වේ. පළමුවන පරිච්ඡේදය යටතේ හැඳින්වීම, සාහිත්‍ය සමීක්ෂා, පර්යේෂණය සිදුකළ ක්‍රමවේදය, එම පර්යේෂණයේ අරමුණු හා සමිතිය ආරම්භවීමට පාදක වූ පසුබිම සාකච්ඡා කර ඇත. තදනන්තරව, ඉංග්‍රීසි නිලධාරීන් විසින් ආරම්භ කළ මෙම සමිතිය අනුක්‍රමයෙන් ශ්‍රී ලාංකික මධ්‍යම පංතියට මාරු වූ ආකාරය පිළිබඳව විශේෂ විමර්ශනයක් කර ඇත. තවද, සමිතිය ආරම්භ වීමට ප්‍රථම මෙරට තිබූ ඉංග්‍රීසි පුවත්පත් මෙන් ම සඟරා හඳුනාගැනීමත්, එම ප්‍රකාශන පසුබිම සමිතියේ සඟරාවේ ආරම්භය කෙරෙහි බලපෑ ආකාරයත් එම සඟරාවලට වඩා සමිතියේ සඟරාව විශේෂ වන්නේ ඇයි ද යන්නත් සාකච්ඡා කර ඇත.

මෙහි දෙවන පරිච්ඡේදයේ සමිතියේ ප්‍රභවය සහ අභිවර්ධනය පිළිබඳව තොරතුරු අඩංගු කර තිබේ. දහනමවන සියවසේ මෙරට ආරම්භ වූ සමිතියේ ඉතිහාසය අධ්‍යයනය කිරීම මෙහි දී සිදුකර ඇත. සමිතියේ නෛතික තත්ත්වය යන අනුමාතෘකාව යටතේ සමිතිය පවත්වාගෙන යාමට අවශ්‍ය භෞතික සම්පත් සහ එහි ව්‍යවස්ථාවේ අනුක්‍රමික විකාශය පිළිබඳව අධ්‍යයනයක් සිදුකිරීමට එහි දී විශේෂ අවධානය යොමුකර ඇත. එමෙන් ම සඟරාවේ ශාස්ත්‍රීයභාවය ආරක්ෂා කරගැනීම සඳහා නිලධාරී මණ්ඩලය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග මොනවා ද යන්න සාකච්ඡා කර ඇත.

1845-1995 දක්වා සමිතියේ සඟරාවේ අන්තර්ගත ලිපි අතරින් ඉතිහාසය හා පුරාවිද්‍යාව යන විෂයන්ට අදාළ ලිපි තෝරාගෙන ඒවා තත් විෂයන්ට සම්බන්ධ අනු විෂයන් යටතේ ගොනුකිරීම මෙහි තුන්වන පරිච්ඡේදය තුළින් සිදුකර තිබේ. එහිදී ඒ ඒ විෂයන්ට අදාළ ලිපි මෙන් ම එම ලිපි සම්පාදනය කළ සමාජීයවිද්‍යාඥයින් ද හඳුනා ගැනීමට උත්සාහ කරන ලදි.

ඒ අනුව, ශාස්ත්‍රීය වශයෙන් මෙරට අධ්‍යයන ක්ෂේත්‍රයට මෙහෙයක් සිදුකර ඇති සමාජීයවිද්‍යාඥයින් කිහිප පොලක් පිළිබඳව මෙම පරිච්ඡේදය අවසානයේ සාකච්ඡා කර තිබේ.

මෙහි හතරවන පරිච්ඡේදය සමිතියේ ශාස්ත්‍රීය සේවය අධ්‍යයනය කිරීම සඳහා වෙන්කර ඇත. එහිදී සමිතිය මගින් සිදුකළ ශාස්ත්‍රීය සේවය හා එමගින් ප්‍රකාශිත සඟරාව මගින් සිදුවූ ශාස්ත්‍රීය සේවය යන කොටස් දෙක යටතේ කරුණු ගොනුකර තිබේ. සිංහල-ඉංග්‍රීසි, ඉංග්‍රීසි-සිංහල ශබ්ද කෝෂය සකස් කිරීම, ලංකාව පිළිබඳ චීන වාර්තා පරිවර්තනය කිරීම, ඓතිහාසික අත්පිටපත් ආරක්ෂා කිරීමට කටයුතු කිරීම ආදී වශයෙන් අනු මාතෘකා 7 ක් යටතේ සමිතිය මගින් සිදුකළ ශාස්ත්‍රීය සේවය ඇගයීමකට ලක්කර ඇත.

සමිතියේ සඟරාව තුළින් සිදුවූ ශාස්ත්‍රීය සේවය ඇගයීමේ දී මීට ඉහත පරිච්ඡේදයේ ලිපි වර්ගීකරණය උපයෝගී කරගෙන ඇත. එහි ඇති අනුවිෂයන් 5 ක් යටතේ සමිතියේ සඟරාවේ පළවූ ලිපි මෙන්ම ඊට පසුකාලීනව පළවූ ශාස්ත්‍රීය සඟරාවේ ලිපි රැගෙන ඒ පිළිබඳව හැකි පමණ සංසන්දනාත්මක අධ්‍යයනයක් මෙහි දී සිදුකර ඇත. එමගින් මෙරට ඉතිහාස සහ පුරාවිද්‍යා විෂය ක්ෂේත්‍රවලට ලැබුණු දායකත්වය කෙතරම් ද යන්න පෙන්වීමට උත්සාහයක් ගෙන ඇත. එමෙන්ම සමිතියේ සඟරාව ද්විතියීක මූලාශ්‍රයක් වශයෙන් පමණක් නොව මූලික මූලාශ්‍රයක් වශයෙන් ද වැදගත් වන බව පෙන්වා දී ඇත.

පස්වන පරිච්ඡේදය තුළින් පර්යේෂණය පිළිබඳ සමාලෝචනය හා ඉන් බැසගත හැකි නිගමන ඉදිරිපත් කර තිබේ. එහි දී අවුරුදු 150 කට වැඩි කාලයක් මෙම සඟරාවේ ඉතිහාසය හා පුරාවිද්‍යා විෂය සඳහා ලැබුණු විශේෂ අනුග්‍රහය මතුකොට පෙන්වා දී ඇත. ඊට අමතරව, උපග්‍රන්ථ සහ ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය ඇතුළත් කර ඇත. මෙම පර්යේෂණයේ දී හමු වූ දුර්ලභ ගණයේ ලිපි ලේඛන පර්යේෂකයන්ට පහසුවෙන් පරිශීලනය කිරීමට හැකිවන පරිදි උපග්‍රන්ථවලට ඇතුළත් කර තිබේ.

# පටුන

පිටු අංකය

| | | |
|---|---|---|
| | උපකාරක සැමරුම්. | I-II |
| | සංක්ෂේපය. | III-IV |
| | පටුන | V-VII |
| | ABBREVIATIONS | VIII |

පළමුවන පරිච්ඡේදය :

| | | |
|---|---|---|
| | හැඳින්වීම, සාහිත්‍ය සමීක්ෂා, ක්‍රමවේදය හා අරමුණු. | 1-29 |
| 1.1 | හැඳින්වීම. | |
| 1.2 | සාහිත්‍ය සමීක්ෂා. | |
| 1.3 | ක්‍රමවේදය. | |
| 1.4 | අරමුණු. | |
| 1.5 | සමිතියේ ප්‍රභවයට මුල් වූ දේශපාලන ආර්ථික හා අධ්‍යාපනික පසුබිම. | |
| 1.5.1 | දේශපාලන පසුබිම තුළින් මධ්‍යම පංතියක ප්‍රභවය. | |
| 1.5.2 | වතු වගාව තුළින් වැවිලි කාර්මික මධ්‍යම පංතියක් බිහිවීම. | |
| 1.5.3 | අධ්‍යාපන පසුබිම. | |

දෙවන පරිච්ඡේදය :

| | | |
|---|---|---|
| | ශ්‍රී ලංකාවේ රාජකීය ආසියාතික සමිතියේ ප්‍රභවය සහ අභිවර්ධනය. | 30-92 |
| 2.1 | සමිතිය ආරම්භවීමට හේතු. | |
| 2.2 | සමිතියේ පරමාර්ථ. | |
| 2.3 | සමිතියට යටිතල පහසුකම් සපයා ගැනීම. | |
| 2.4 | සමිතියේ නෛතික තත්ත්වය. | |
| 2.4.1 | සමිතියේ නිලධාරී මණ්ඩලය. | |
| 2.4.2 | නිලධාරී මණ්ඩලය තෝරාපත් කර ගැනීම. | |
| 2.4.3 | සමිතිය මගින් පවත්වන රැස්වීම්. | |
| 2.4.4 | පාලක සභාව, එහි ක්‍රියාකාරිත්වය සහ බලතල. | |
| 2.4.5 | කාරක සභා සහ එහි කාර්යභාරය. | |
| 2.4.6 | භාරකාර මණ්ඩලය. | |
| 2.4.7 | සමිතියේ සාමාජිකත්වය සඳහා තෝරා ගැනීම. | |
| 2.4.8 | සමිතියේ මුදල් ප්‍රතිපාදන. | |
| 2.4.8.1 | සාමාජික ගාස්තු. | |
| 2.4.8.2 | සමිතිය රජයෙන් ලත් මුදල් ප්‍රතිපාදන. | |
| 2.4.8.3 | සමිතියට පරිත්‍යාග වශයෙන් ලැබුණු මුදල්. | |
| 2.5 | රාජකීය ආසියාතික සමිතියේ ශාඛා සමිතිවල ව්‍යාප්තිය. | |

තෙවන පරිච්ඡේදය :

ක්‍රි.ව. 1995 වන විට සමිතිය මගින් ප්‍රකාශිත ඉතිහාස සහ පුරාවිද්‍යා විෂයයන්ට අයත් ලිපි වර්ග කිරීම සහ සමාජීයියවිද්‍යාඥයින් හඳුනා ගැනීම. 93-170

3.1 හැඳින්වීම.

3.1.1 ඉතිහාස විෂයට අයත් ලිපි.

1. ETHNIC STUDIES
2. ADMINISTRATION AND CIVIL WARS
3. CHRONOLOGY
4. ORIGIN OF THE SINHALA LANGUAGE AND DICTIONARY
5. EDUCATION
6. FOLKLORE
7. INDIA HISTORY
8. JANA KREEDA
9. HISTORICAL LITERATURE
10. MANUSCRIPTS
11. MEDICINE
12. REGIONAL HISTORY
13. RELIGIOUS HISTORY
14. ROYAL ASIATIC SOCIETY
15. SOCIAL AND CULTURAL HISTORY
16. TRANSPORT
17. KING & CROWN
18. NATIONAL MOVEMENT IN SRI LANKA
19. IRRIGATION TECHNOLOGY
20. TRADE-AGRICULTURAL PRODUCTS

3.1.2 පුරාවිද්‍යා විෂයට අයත් ලිපි.

1. ARTS AND CRAFT
2. COINS & CURRENCY
3. GEOGRAPHY AND GEOLOGY
4. INSCRIPTIONS AND SANNAS
5. MONUMENTS AND RUINS
6. REPORTS
7. FOSSIL ANIMALS IN CEYLON

3.2 සමාජීයියවිද්‍යාඥයින් හඳුනාගැනීම.

3.2.1 එල්.එච්. මොඩර්.

3.2.2 ඊ.ඩබ්. පෙරේරා.

3.2.3 ටී.බී. කරුණාරත්න.

3.2.4 ජෝන් ස්ටිල්.

3.2.5 ඒ.ඩී.එන්. ප්‍රනාන්දු

3.2.6 ජේ.පී. ලුවිස්.

3.2.7 ඒ. ඕ. බ්‍රෝඩි

3.2.8 ආර්. රැවන්හාර්ට්

3.2.9 ජෝර්ජ් වෝල්

හතරවන පරිච්ඡේදය :

ශ්‍රී ලංකාවේ රාජකීය ආසියාතික සමිතියේ ශාස්ත්‍රීය සේවය. 171-258

4.1 හැඳින්වීම.

4.1.1 සමිතියේ සඟරාව.

4.1.2 මූලික මූලාශ්‍රයක් වශයෙන් සඟරාවේ වැදගත්කම.

4.1.3 ශබ්ද කෝෂ සකස් කිරීම.

4.1.4 පාලිග්‍රන්ථ නැවත මුද්‍රණය කිරීම.

4.1.5 මාලදිවයින පිළිබඳ පර්යේෂණාත්මක අධ්‍යයනය.

4.1.6 ලංකාව පිළිබඳව සඳහන් වීන වාර්තා ඉංග්‍රීසියට පරිවර්තනය කිරීම.

4.1.7 මහාවංසය ඉංග්‍රීසියට පරිවර්තනය කිරීම.

4.1.8 ඓතිහාසික අත්පිටපත් ආරක්ෂා කිරීමට කටයුතු කිරීම.

4.1.9 කෞතුකාගාරයක් ආරම්භ කිරීමට කටයුතු කිරීම.

4.2 සමිතියේ සඟරාවේ පළවී ඇති ලිපි වලින් අදාළ විෂයට ලැබී ඇති දායකත්වය.

4.2.1 හැඳින්වීම.

4.2.2 සමිතියේ සඟරාවට පෙර මෙරට ප්‍රකාශිතව තිබූ පුවත්පත් සහ සඟරා. (ලුහුඬු සමීක්ෂණයක්)

4.2.3 සමිතියේ සඟරාවේ ආරම්භය.

4.2.4 වෙනත් පිළිගත් සඟරාවලින් අදාළ විෂයට ලැබී ඇති දායකත්වය.

4.2.4.1 Ancient Ceylon.

4.2.4.2 Ceylon Journal of Science.

4.2.4.3 University of Ceylon Review.

4.2.4.4 Ceylon Historical Journal.

4.3 කාසි පිළිබඳ ව ලියවුණු ලිපි.

4.4 චිත්‍ර හා චිත්‍ර කලාව ඉතිහාසය පිළිබඳ ව ලියවුණු ලිපි.

4.5 නටබුන් පිළිබඳ ව ලියවුණු ලිපි.

4.6 සෙල්ලිපි පිළිබඳ ව ලියවුණු ලිපි.

4.7 ලංකාවේ වාරිමාර්ග කටයුතු පිලිබඳව ලියවුණු ලිපි.

පස්වන පරිච්ඡේදය :

සමාලෝචනය හා නිගමනය. 259-262

5.1 සමාලෝචනය.

5.2 නිගමනය.

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය 263-285

උපග්‍රන්ථ. 286-315

## ABBREVIATIONS

| | | |
|---|---|---|
| *CCP* | - | *The Colebrooke – Cameron Papers* |
| *ELC* | - | *English Literature in Ceylon* |
| *HRAS* | - | *History of the Royal Asiatic Society* |
| *JRAS (CB)* | - | *Journal of the Royal Asiatic Society (Ceylon Branch)* |
| *JRAS (Sri Lanka), NS* | - | *Journal of the Royal Asiatic Society (Sri Lanka), New Series* |
| *JRAS(GBI)* | - | *Journal of the Royal Asiatic Society (Great Britain and Ireland)* |
| *SCRAS* | - | *Sesquicentennial Commemorative Volume of the Royal Asiatic Society of Sri Lanka* |
| *UCHC* | - | *University of Ceylon, History of Ceylon* |

# ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සමිතියේ අරමුණු හා කාර්ය සාඵල්‍යය (1845-1995) - ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනවලට ඒ තුළින් ලැබුණු දායකත්වය පිළිබඳ විශේෂ අවධානය යොමුකරමින්


එම්. ඒ. එස්. ආර්. සංජීවි මන්ත්‍රීරත්න

G.S./S.S./599/98



ශාස්ත්‍රපති

2004

## පළමුවන පරිච්ඡේදය : හැඳින්වීම, සාහිත්‍ය සමීක්ෂා, ක්‍රමවේදය හා අරමුණු.

### 1.1 හැඳින්වීම.

ශ්‍රී ලංකා ඉතිහාසය නැවත ගොඩනැගීමට දායක වූ සංවිධාන ගණනාවක් දහනමවන සහ විසිවන සියවස්වලදී මෙරට බිහිවිය. මෙම සංවිධාන අතර කොළඹ ඇකඩමිය (1836), අධ්‍යාපන දෙපාර්තමේන්තුව (1865), විද්‍යෝදය පිරිවෙන (1873), විද්‍යාලංකාර පිරිවෙන (1875), ආනන්ද විද්‍යාලය (1887), ලංකාවේ පුරාවිද්‍යා සමීක්ෂණය (දෙපාර්තමේන්තුව)[1] (1890), ප්‍රාචීන භාෂෝපකාර සමාගම (1902) ආදිය ඒ අතර වේ. එම සංවිධාන අතර ශ්‍රී ලංකාවේ රාජකීය ආසියාතික සමිතිය ද මෙරට ඉතිහාසය නැවත ගොඩනැගීම සඳහා සුවිශේෂ මෙහෙවරක් ඉටුකර ඇති ආයතනයකි.

අපගේ පර්යේෂණයෙන් මූලික වශයෙන් බලාපොරොත්තු වන්නේ එම සමිතිය මගින් ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනයට දෙන ලද දායකත්වය විභාගකර බැලීමත් ඒ අනුව ඉදිරියට යමින් ලංකා ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනය සඳහා උපයෝගීකර ගත හැකි මූලාශ්‍රයක් වශයෙන් එහි ඇති වැදගත්කම පරීක්ෂාකර බැලීමත් ය.

ඉතිහාසවිද්‍යාවේ[2] දී මූලාශ්‍රය පුළුල් අර්ථයෙන් වර්ග දෙකකට සම්ප්‍රදායානුකූලව බෙදේ : (සුප්‍රකට) මූලික මූලාශ්‍රය සහ ද්විතීයික මූලාශ්‍රය වශයෙනි. ශ්‍රී ලංකාවේ රාජකීය ආසියාතික සමිතිය 1845 තරම් ඈත කාලයක ආරම්භ වූ නිසා දහනමවන සියවසේ දෙවන භාගයේ සිට ලංකාවේ පැවැති ඇතැම් ඓතිහාසික තොරතුරු අධ්‍යයනය කිරීමට ද මෙම ශාස්ත්‍රීය සංග්‍රහයෙන් ප්‍රයෝජනයක් සැලසේ. එකල පැවැති ශ්‍රී ලංකාවේ ජාතික පුනරුද ව්‍යාපාරයේ ඇතැම් ලක්ෂණ හඳුනාගැනීමට ද එම ව්‍යාපාරයේ පුරෝගාමීන් ලෙස කටයුතු කළ උගත් මධ්‍යම පන්තිය සහ කෘෂිකාර්මික මධ්‍යම පන්තිය පිළිබඳව ද, උගත් පූජ්‍ය සහ පූජක පක්ෂය පිළිබඳව ද මෙම ශාස්ත්‍රීය සංග්‍රහය තුළින් ලබාගත හැකි සාධක අනල්ප ය. එසේ ම, එම වකවානුවේ සිට ඉදිරි කාලපරිච්ඡේදය තුළ ඇතිවූ සාහිත්‍ය සහ සංස්කෘතික කටයුතු පිළිබඳව ද මින් ලබාගත හැකි සාධක බෙහෙවින් ප්‍රයෝජනවත් ය.

---

1 ආරම්භයේදී මේ නමින් හඳුන්වන ලදී. (Archaeological Survey of Ceylon) පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව නමින් හඳුන්වනු ලැබුවේ පසුකාලීනවයි.

2 මේ පිළිබඳව පිළිගත් පාරිභාෂික වචනයක් නොමැත. ඉංග්‍රීසියෙන් Historiography යන්න යෙදේ.මෙය සමහර අය ඉතිහාසවිද්‍යාව, ඉතිහාසකරණය, ඉතිහාසවේදය යනුවෙන් භාවිතා කරති. Geography යන්න භූගෝල විද්‍යාවත් Cartography යන්න සිතියම්විද්‍යාව ලෙස භාවිතා කරනු ලබන හෙයින් මෙම පර්යේෂණයේදී යොදාගනු ලැබුවේ ඉතිහාසවිද්‍යාව යන වචනයයි.

ලංකා පුරාවිද්‍යා සමීක්ෂණයේ වාර්තා ලිවීමට ප්‍රථමයෙන් සිදුවූ ඓතිහාසික සහ පුරාවිද්‍යාත්මක ගවේෂණ පිළිබඳ ව වාර්තා ඉදිරිපත් කරමින් මෙම ශාස්ත්‍රීය සංග්‍රහය රැස්කොට ඇති තොරතුරු වෙනත් කිසිදු මූලාශ්‍රයකින් නොලැබේ. එහෙයින් සමිතියේ සඟරාව පමණක් වුව ද දිවයිනේ හටගත් ශාස්ත්‍රීය හා සංස්කෘතික කටයුතුවල එක්තරා අවස්ථාවක් සනිටුහන් කරයි. මෙම කරුණු සමස්තයක් ලෙස සලකා බලන විට අපගේ සමීක්ෂණයට භාජනය වන්නා වූ ශාස්ත්‍රීය සංග්‍රහය මූලික මූලාශ්‍රයක් වශයෙන් ද සැලකිය හැකිය.

ද්විතීක මූලාශ්‍රයක් වශයෙන් එහි ඇති අගය විශේෂයෙන් මතුකොට දැක්වීමට අවශ්‍යතාවක් නැතත් ඉතිහාස සහ පුරාවිද්‍යා අධ්‍යයනවල කිනම් අංශවලට එයින් ආලෝකයක් විහිදුවන්නේ ද යන්න ගැන විශේෂ අවධානය යොමුකළ යුතු ය.

මෙම අධ්‍යයනයේදී මූලික මූලාශ්‍රයක් වශයෙන් ඉතිහාස අධ්‍යනයට ලැබෙන ආලෝකය ගැඹුරින් අධ්‍යයනය කිරීමට බලාපොරොත්තු වනු ලැබේ. එය එසේ කරනු ලබන්නේ විසිඑක්වන සියවසට පෙර ලංකා ඉතිහාසය ගොඩනගා ගැනීම සඳහා ඉවහල්වන පර්යේෂණ රාශියක ප්‍රතිපල මෙම සඟරා කලාපයන්හි සංගෘහිත නිසා ය.

එසේම ඉතිහාසවිද්‍යාවේ වස්තු විෂයට අන්තර්ගත වන්නා වූ වැදගත් ලක්ෂණයක් නම් ඉතිහාසඥයන් පිළිබඳව අධ්‍යනය කිරීම ය. ඒ තුළින් ඉතිහාසවිද්‍යාවේ ඉතිහාසය හා විකාශය පිළිබඳව අධ්‍යයනය කළ හැකි බැවිනි. මෙම ශාස්ත්‍රීය සංග්‍රහය තුළින් අප අතරට පැමිණෙන ලංකා ඉතිහාසයේ පුරෝගාමී ඉතිහාසඥයෝ කිහිප දෙනෙක් වෙති. ඔවුන්ගේ ශාස්ත්‍රීය පර්යේෂණ මෙම සංග්‍රහයේ අන්තර්ගතව ඇති බැවින් ඒ ඔස්සේ ගොස් ඉතිහාස විද්‍යාවට සහ ඉතිහාස ක්ෂේත්‍රයට දහනමවන සියවසේ මැද භාගයේ සිට සම්බන්ධ වූ පුරෝගාමී ඉතිහාසඥයින් කවුරුන් ද යන්න ගැන අධ්‍යයනයක යෙදීමට ද බලාපොරොත්තු වනු ලැබේ. සමිතිය ආරම්භ වූ 1845 වර්ෂයේ සිට 1995 වර්ෂය දක්වා වූ වසර 150 පමණ කාල පරිච්ඡේදයක් මෙම අධ්‍යයනයට භාජනය වෙයි.